## ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව

### සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ සුරාබදු නියාමක රියදුරු තනතුර සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා පහත සඳහන් සුදුසුකම් ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ:-

02. පහත දක්වනු ලබන ආදර්ශ ඉල්ලුම්පත්‍රය ප්‍රකාර සකස් කරගත් ඉල්ලුම් පත්‍ර 2026.10.30 වැනි දින හෝ ඊට පෙර "සුරාබදු කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව, අංක 353, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ "සුරාබදු නියාමක රියදුරු තනතුර" යනුවෙන් සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වා එවනු නොලැබේ.

*විභාග ගාස්තුව රු.600 කි. එම ගාස්තුව සුරාබදු කොමසාරිස් ජනරාල් නමින් ලංකා බැංකුව තැප්‍රොබේන් ශාඛාවේ විවෘත කර ඇති 7041628 ගිණුම් අංකයට බැර කර එහි ලදුපතෙහි මුල් පිටපත ඔබගේ අයදුම්පතෙහි නියමිත ස්ථානයෙහි අලවන්න.

**03. මාසික වැටුප් ක්‍රමය :** රුපියල් 49,550-7x540-27x670-71,420/- ක් වේ. රු. 49,550 ක් වූ මාසික වැටුප මත පිහිටවනු ලැබේ. (රා.ප.ච. 10/2025 ට අනුව RS 01-2025 (PC) උක්ත වැටුප් ක්‍රමයේ 50,630 වැටුප් තලය ඉක්මවා යාමට පෙර පළමු කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

**04. වයස් සීමාව:-** ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතු ය.

05. තනතුරට බඳවා ගැනීමට අදාළ සියළු සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී තිබිය යුතු ය.

**(i) අධ්‍යාපන සුදුසුකම් :-**
අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී එක් වරකදී විෂයන් 05 කට නොඅඩුව සමත්ව, දෙවරකට නොවැඩි වාර ගණනක දී සිංහල / දෙමළ භාෂාව හා වෙනත් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) සමත් වී තිබීම.

**(ii) වෘත්තීය සුදුසුකම් :-**

a. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳව මනා දැනුමක් ලබා තිබීම.
b. මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව මූලික දැනුමක් ලබා තිබීම.
c. මෝටර් බස් රථ, මෝටර් කෝච්, "A" පන්තිය පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු රියදුරු බලපත්‍රයක් ලබා තිබීම.

**(iii) සේවා පළපුරුද්ද :-**

අදාළ ඛණ්ඩයේ රියදුරු බලපත්‍රයක් ලබා ගැනීමෙන් අනතුරුව වසර 03 ක මෝටර් වාහන රියදුරෙකු වශයෙන් පිළිගත් ආයතනයක සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**(iv) කායික සුදුසුකම් :-**

a. උස අවම වශයෙන් 5' 4" විය යුතු ය.
b. ප්‍රාශ්වාසයේ දී පපුව අවම වශයෙන් 32 (අඟල්) විය යුතු ය.
c. උපැස් යුවලක් හෝ ස්පර්ශ කණ්නාඩි රහිතව භාණ්ඩ හැඳිනීමේ දෘෂ්ටිය ඇතුළුව අවම වශයෙන් 6/6 හා 6/12 ඇස් පෙනීමකින් යුක්ත විය යුතු ය.
d. සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට හා තනතුරේ රාජකාරි ඉටුකිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(v) වෙනත් සුදුසුකම් :-**

අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු අතර, විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

**06. බඳවා ගන්නා ක්‍රමය:**

(i) රජයේ *ගැසට් පත්‍රයේ* දැන්වීමක් පළකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීමක් පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් ඉල්ලුම්පත් කැඳවා සුදුසුකම් ලත් අයදුම්කරුවන් ලිඛිත පරීක්ෂණයකට භාජනය කෙරේ. මෙම ලිඛිත පරීක්ෂණ සිංහල හා දෙමළ භාෂාවලින් පැවැත්වෙන අතර මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳව සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා පවත්වනු ඇත. ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍ය පසුව වෙනස් කිරීම සඳහා ඉඩ දෙනු නොලැබේ.

(ii) එම ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් පුරප්පාඩු සංඛ්‍යාව මෙන් දෙගුණයක් වන සේ කායික යෝග්‍යතා පරීක්ෂණයට හා රිය පැදවීමේ ප්‍රායෝගික වෘත්තීය පරීක්ෂණයකට භාජනය කොට, ඉන් සමත් වූ අය ඔවුන් එම පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණු හා ලිඛිත පරීක්ෂණයෙන් ලබා ගත් ලකුණු වල කුසලතා අනුපිළිවෙල අනුව සුරාබදු නියාමක රියදුරු තනතුරට පත් කිරීම සඳහා තෝරා ගනු ඇත.

**(iii) ලිඛිත විභාගය :**

| *විෂයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| (i.) මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | පැය 03 | 100 | 40% |
| (ii.) පොදු ප්‍රශ්න පත්‍රය | පැය 01 වි.30 | 100 | 40% |

**විභාගය සඳහා වන විෂය නිර්දේශය:**

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| **1.** මහා මාර්ග නීති හා මෝටර් යාන්ත්‍රික විද්‍යාව | මහා මාර්ග නීති පිළිබඳව දැනුම කාර්මික ක්ෂේත්‍රයන් පිළිබඳව දැනුම සහ එම ක්ෂේත්‍රයන්ට අදාල දෝෂයන් පිළිබඳව මූලික අවබෝධය මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රයකි. |

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| **ii.** පොදු ප්‍රශ්න පත්‍රය | අයදුම්කරුවන්ගේ සාමාන්‍ය දැනුම මැන බැලීම සඳහා සකස්වන පොදු ප්‍රශ්න පත්‍රයකි. |

**පවත්වන බලධරයා : පත්කිරීම් බලධරයා හෝ පත්කිරීම් බලධරයා විසින් අනුමත කරනු ලබන ආයතනයක් මගින්**

**(iv) වෘත්තීය පරීක්ෂණය : රිය පැදවීමේ නිපුනත්වය මැනීමේ ප්‍රායෝගික පරීක්ෂණයකි.**

| | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| රිය පැදවීමේ නිපුනතාවය | 40 | 40% |

**පවත්වන බලධරයා:** මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ - මෝටර් රථ පරීක්ෂකවරයකු, පොලිස්සේවයේ නිලධාරියකු හා දෙපාර්තමේන්තුවේ නිලධාරියකුගෙන් සමන්විත මණ්ඩලයක අධීක්ෂණය යටතේ සුරාබදු කොමසාරිස් ජනරාල්ගේ මෙහෙය වීම යටතේ මෙම වෘත්තීය පරීක්ෂණය පවත්වනු ඇත.

**v) කායික යෝග්‍යතා පරීක්ෂණය :** බඳවා ගැනීමේ පටිපාටියේ 7.2.2.4 වගන්තිය අනුව අදාල සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා

**(vi) සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය:**

**ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු:**
සුරාබදු නියාමක රියදුරු තනතුරට සෑම අතින්ම යෝග්‍ය පුද්ගලයකු ද, යන්න පරීක්ෂා කිරීම අවශ්‍ය

මූලික සුදුසුකම් තිබේද යන්න පරීක්ෂා කර බැලීම (සහතික පත් පරීක්ෂාව)

සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරන බලධරයා : සුරාබදු කොමසාරිස් ජනරාල්

07. සේවා නියුක්ත කරවීමේ කොන්දේසි :

මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට ඔබ යටත් විය යුතු වේ. තවද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට / වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු ය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය. මෙම තනතුර සුරාබදු දෙපාර්තමේන්තුවේ නියෝග යටතේ පාලනය වන නිල ඇඳුම් (යුනිෆෝම්) අදින තනතුරකි.

08. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක : 2310/29 හා 2022.12.14 දිනැති අති විශේෂ *ගැසට් පත්‍රයෙන්* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන කොන්දේසි හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාළ වේ.

09. මෙම පත්වීමට අදාළ බඳවා ගැනීම් පටිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙතින් විමසා ඒ පිළිබඳව තීරණය කරනු ලැබේ.

10. සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන ඉල්ලුම්කරුවන්ට ඒ බැව් ලිඛිතව දන්වනු ලැබේ. මේ සඳහා ගමන් වියදම් ආදිය ගෙවනු නොලැබේ.

**එම්. බී. එන්. ඒ. පේමරත්න,**
සුරාබදු කොමසාරිස් ජනරාල්.

2026 සැප්තැම්බර් මස 30 වැනි දින,
ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුවේ දී ය.